# සංස්කෘතික උරුමය ආරක්ෂා කර ගැනීම සඳහා කළමනාකරණය සැලැස්මක් ( කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කළුතර වැල්ලබඩ විහාරය ඇසුරින් )

ආර්.එල්.ඩී. රසාදිකා, කේ.ඩී.නිසංසලා*

කළුතර දිස්ත්‍රික්කයේ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කළුතර තොටමුණ උතුරු කළුතර වෙරළබඩ ප්‍රදේශයේ පර්යේෂණයට බඳුන් වූ විහාරස්ථානය පිහිටා තිබේ. කළුතර වැල්ලබඩ පන්සල යැයි ප්‍රසිද්ධියට පත්ව ඇති පුලිනතලාරාමයෙහි මහනුවර යුගයට අයත් සිතුවම් සහිත එක් කුඩා විහාර මන්දිරයකි. ක්‍රි.ව.17 වන සියවසේ මුල්කාලයේ පෘතුගීසින්ගේ අයහපත් ක්‍රියාකාරිත්වය නිසා මෙම විහාරය වරෙක පොළොවට සමතලා කර ඇත. අනතුරුව බලයට පත් වූ ඕලන්දයන්ගේ කාලයේ නැවත මෙම විහාරය ගොඩනගා ඇත. පසුකාලින ඉංග්‍රීසි පාලන සමයේ දී මෙම විහාරය සංවර්ධනයක් ලබන්නට ඇති බව පැරණි චෛත්‍ය වටා ඉදිකර ඇති තාප්පය හා තොරණ මගින් කිව හැකිය. පෞරාණික වටිනා කමක් සහිත මෙම විහාරයෙහි ඉතිහාසය පිළිබඳ වැදගත් තොරතුරු අද වන විට වරින් වර එල්ලවූ සතුරු බලපෑම් හමුවේ විනාශ වන්නට ඇතැයි සිතිය හැක. අඳුරු යුගයක් පසු කළ මෙම විහාරය පූජ්‍ය කතලුවේ ගුණරතන හිමියන් තුළින් ආලෝකය ලබා අද වන විට කළුතර ප්‍රදේශයේ වැල්ලබඩ පන්සල නමින් ප්‍රසිද්ධියට පත් වී ඇත. විහාර මන්දිරයෙහි ඇතුලත හා පිටත සිතුවම් මුළු බිත්තියම වසා සිටින අතර පිටත බිත්තියෙහි රේඛා සටහන් පමණක් ඉතිරිව ඇත. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වූයේ සිතුවම් හඳුනාගැනීම හා වාර්තා කිරීම හා ස්වභාවික සාධක සහ මානව බලපෑම් මත දිනෙන් දින හායනය වෙමින් විනාශ වන මහනුවර යුගයේ සිතුවම් අනාගත පරපුර වෙනුවෙන් කළමනාකරණය සැලැස්මක් සකස් කිරීමයි. මෙහිදී ප්‍රාථමික මූලාශ්‍ර අධ්‍යයනය කිරීම හා ක්ෂේත්‍රයට ගොස් සිතුවම් නිරීක්ෂණය කිරීම හා හායන කාරක හඳුනාගැනීම, ඒ සඳහා පිළියම් යෙදීම අධ්‍යයන ක්‍රමවේදය ලෙස යොදාගෙන ඇත. වර්තමානය වන විට ක්‍රමයෙන් විනාශයට පත් වී යන මහනුවර යුගයේ සිතුවම් ඇති ස්ථාන ආරක්ෂා කර ගැනීම සඳහා සැලස්මක් ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනය තුළින් අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පද : උරුම, කළමනාකරණය, සිතුවම්, ආරක්ෂා කිරීම, යටත් විජිතය

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැළණිය විශ්වවිද්‍යාලය rasadikadilhani123@gmail.com